ධර්ම පත්‍රිකා අංක: 4

# හිතේ පහල වන ගති 52
## (චෛතසික පනස්දෙක)

‘ඒකුප්පාද නිරෝධා ච – ඒකාලම්බන වත්ථුකා
චේතෝ යුත්තා ද්විපඤ්ඤාස – ධම්මා චේතසිකා මතා’

සිත සමඟ උපදින – සිත සමඟ නැතිවී යන
එක අරමුණක–වස්තුවක හැසිරෙන – චෛතසිකයෝ දෙපණසකි

---

| | | |
|---|---|---|
| 1. | ඵස්සය | සිත අරමුණට සැපෙන, සම්බන්ධවන ගතිය |
| 2. | වෙදනා | අරමුණ වින්දනය කරන ගතිය |
| 3. | සඤ්ඤාව | අරමුණ සටහන් කරගන්නා ගතිය |
| 4. | චේතනාව | සිත ක්‍රියාකරවීමේ උත්සාහ ගතිය |
| 5. | ඒකග්ගතා | සිත අරමුණෙහි පිහිටන ගතිය |
| 6. | ජීවිතින්ද්‍රිය | චිත්ත–චෛතසිකයන් ජීවත් කරවන–පවත්වන ස්වභාවය |
| 7. | මනසිකාරය | නැවත නැවතත් අරමුණට හිත යොවදන ගතිය |
| | | |
| 8. | විතක්ක | අරමුණ වෙතට හිත නැගී යන ස්වභාවය |
| 9. | විචාරය | අරමුණේ හිත පැතිරෙන, ඇතිල්ලෙන ගතිය |
| 10. | අධිමොක්ඛ | අරමුණේ හොඳ/නරක විනිශ්චය කරගන්නා ගතිය |
| 11. | වීර්ය | සිත අරමුණට යෑමේ හැකිබව. වීර්‍ය්‍ය ගතිය. ශක්ති ස්වභාවය |
| 12. | ප්‍රීතිය | අරමුණේ හිත පැහැදී යන ස්වභාවය |
| 13. | ඡන්දය | අරමුණට යෑමේ කැමැත්ත – ඕනෑකරන ගතිය |
| | | |
| 14. | මෝහය | අරමුණේ සැබෑ තත්වය නොපෙන්වන ගතිය, වසන ස්වභාවය |
| 15. | අහිරික | නරක දෙයට (පාපය) අකැමැති නොවන ස්වභාවය |
| 16. | අනොත්තප්ප | නරක දේ (පාපය) ගැන කිසි බියක් නොදැනී යන ගතිය |
| 17. | උද්ධච්චය | සිතේ සැලෙන ගතිය, අරමුණේ හොඳින් නොපිහිටන ගතිය |
| 18. | ලෝභය | අරමුණේ ඇලෙන ගතිය, බැඳෙන ස්වභාවය |
| 19. | දිට්ඨිය | අරමුණ වරදවා දකින ස්වභාවය, වරදවා පිළිගන්නා ගතිය |
| 20 | මානය | අරමුණ වෙත යන සිත (තමන්ම) මැන ගන්නා ගතිය |
| 21. | දෝස | අරමුණ එපාවන, අරමුණට කැමැති නැති ගතිය |
| 22. | ඉස්සා | අන් අයගේ හොඳ ගති, සැප සම්පත් නොඉවසන ගතිය |
| 23. | මච්ඡරිය | තමා සතු දේ (අරමුණ) වෙන කෙනෙකුට අයිතිවනවාට, ප්‍රයෝජන ගන්නවාට අකැමැති ස්වභාවය |
| 24. | කුක්කුච්ච | කළ නොහොඳ ගැන, නොකළ හොඳ ගැන පසුතැවෙන ගතිය |
| 25. | ථීනය | සිතේ දුර්වල ගතිය, වේගවත් නැති ගතිය, ශක්තිය නැති බව |
| 26. | මිද්ධය | චිත්ත ගතිවල (චෛතසික වල) මන්දෝත්සාහි බව, ප්‍රාණවත් බවක් නැතිකම |
| 27. | විචිකිච්චාව | අරමුණ පිළිබඳව සැක කරන ගතිය, තීරණයකට නොඑන ස්වභාවය |

| | | |
|---|---|---|
| 28. | සද්ධා | තුනුරුවන් අදහන – සත්‍යය පිළිගන්නා ගතිය |
| 29. | සතිය | සිත කුසල් අරමුණට, නිවැරදි අරමුණට යොමුකරවන ගතිය |
| 30. | හිරි | අකුසලය, නරක දේ පිළිකුල් කරවන, එපා කරවන ගතිය |
| 31. | ඔත්තප්ප | නරක දෙයට, අකුසලයට බියවන ගතිය. එය නරකක් විනාශයක් ඇති කරන්නක් බව සලකන ස්වභාවය |
| 32. | අලෝභ | අරමුණෙහි සිත නො ඇලෙන ගතිය |
| 33. | අදෝස | අරමුණෙහි සිත නොගැටෙන ස්වභාවය. ද්වෙෂ නොකරන ගතිය හෙවත් මෛත්‍රී ස්වභාවය |
| 34. | තත්‍ර මජ්ඣත්තතා | සිතේ පහළ වන (චෛතසික) ගති ස්වභාවයන් සමව පවත්වන ගතිය. වේගයන් අඩු–වැඩි නොකරන ස්වභාවය |
| 35. | කාය පස්සද්ධි | චෛතසික වල සන්සුන් ගතිය |
| 36. | චිත්ත පස්සද්ධි | අරමුණ දැනගන්නා චිත්තයේ ඇති සන්සුන් ගතිය |
| 37. | කාය ලහුතා | චෛතසිකයන්ගේ සැහැල්ලු බව |
| 38. | චිත්ත ලහුතා | අරමුණ දැන ගන්නා සිතෙහි ඇති සැහැල්ලු බව |
| 39. | කාය මුදුතා | චෛතසිකයන්ගේ මෘදු බව, මොළොක් ගතිය |
| 40. | චිත්ත මුදුතා | අරමුණ දැනගන්නා සිතේ ඇති මෘදු බව, මොළොක් බව |
| 41. | කාය කම්මඤ්ඤතා | චෛතසිකවල ඇති ප්‍රාණවත් ගතිය, වැඩ කිරීමේ සුදුසු ස්වභාවය (කර්මණ්‍ය ස්වභාවය) |
| 42. | චිත්ත කම්මඤ්ඤතා | සිතේ ඇති ප්‍රාණවත් ගතිය, වැඩ කිරීමේ සුදුසු ගතිය (කර්මණ්‍ය ස්වභාවය) |
| 43. | කාය පාගුඤ්ඤතා | අරමුණු කෙරෙහි වැඩ කිරීමට චෛතසිකවලට ඇති හුරු ගතිය (ප්‍රගුණ ගතිය) |
| 44. | චිත්ත පාගුඤ්ඤතා | අරමුණ පිළිබඳව ක්‍රියා කිරීමට චිත්තයට ඇති හුරු ගතිය (ප්‍රගුණ ගතිය) |
| 45. | කාය උජ්ජුකතා | අරමුණ ගැන ක්‍රියා කිරීමට චෛතසිකයන්ට ඇති ඍජු ගතිය. ඇද නැති බව |
| 46. | චිත්ත උජ්ජුකතා | අරමුණ පිළිබඳව දැන ගැනීමට චිත්තයේ ඇති ඇද නැති ගතිය. ඍජු ස්වභාවය |
| 47. | සම්මා වාචා | වචනයෙන් සිදුවන වැරදි වැළැක්වීමට හිතේ ඇතිවන වළක්වන ගතිය. සංවර කරවන ස්වභාවය |
| 48. | සම්මා කම්මන්ත | කයින් සිදුවන වැරදි වැළැක්වීමට සිතේ පහළ වන සංවර කරවන ස්වභාවය |
| 49. | සම්මා ආජීව | ජීවිතය පවත්වා ගැනීමට වුවද කයින්, වචනයෙන් වරදක් කෙරෙන්ට ඉඩ නොදෙන, වළක්වන ගතිය |
| 50. | කරුණා | අනුන්ට දුකක් වෙනවාට අකැමැති, අනුන් දුකෙන් මුදවාලීමට කැමැති ගතිය |
| 51. | මුදිතා | අනුන්ගේ සැපය, සාර්ථකත්වය, සම්පත් ගැන, දියුණුව ගැන සතුටු වන ස්වභාවය |
| 52. | පඤ්ඤා | අරමුණ ගැඹුරු ලෙස මනාව අවබෝධකරගන්නා ස්වභාවය |

සැමට ධර්මාවබෝධය වේවා
තෙරුවන් සරණයි

හන්තේ ජිනාලංකාර
බෝධිඥානාරාම ආරණ්‍යය
ස්ටෝක්ස් වැලි
වෙලින්ටන්
නවසීලන්තය